**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - 2019**
**------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

-------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මේහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී . තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති ,

පටිපාටි පොත්පත් , වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායි ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව , විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාල වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශවීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමග සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍යවේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් වල ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව තක්සේරු නොකිරීම හේතුවෙන් පිරිවැය රු.199,494,369ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කළ අතර ප්‍රත්‍යාගණන වාර්තාව ලැබීමෙන් පසු 2020 ගිණුම්කරණ ප්‍රකාශනයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව වත්කම්වල ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීමට කටයුතු කළයුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකළ යුතු රු.4,145,363ක් වූ විදුලි ආදායමක් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | රු.3,207,200ක් 2020 ජූනි මස වන විට අය කරගෙන ඇති අතර ඉතිරිය අතිරේක බිල්පත් ගෙවීම් අංක II මගින් 2020 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අයකරගත යුතු මුදල් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුලදී රු.1,188,230ක් වැය කර වෛද්‍ය පීඨය පිහිටි ඉඩම වටා ඉදිකර තිබුණු කම්බි වැට ප්‍රාග්ධනිත කර තිබුණද වර්ෂය අවසාන වන විට එය විනාශ වී තිබුණි. එහෙත් එම වටිනාකම ගිණුම්වලින් ලියා හැරීමට කටයුතු කර නොතිබුණි. | මෙම කොන්ත්‍රාත්තුවට අදාළ අවසන් බිල්පත, ගෙවිය යුතු බිල්පත් ලෙස ගිණුම්ගත කිරීම සඳහා යොමු කර තිබුණු බැවින් හා වැඩ නිමවූ ව්‍යාපෘතියක් ලෙස නම් කර තිබූ බැවින් අදාළ බිල්පත ගෙවිය යුතු කොන්ත්‍රාත් බිල්පතක් ලෙස ගිණුම්ගත කර එම අදාළ ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කරන ලදී. | ප්‍රයෝජනයට ගත නොහැකි වත්කම් ගිණුම්වලින් ලියාහැරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වැඩ නිමවී තිබුණු රු.759,174,529ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 05ක වටිනාකම ගොඩනැගිලි ගිණුමට ඇතුළත් නොකර තවදුරටත් කෙරීගෙන යන වැඩ (work in progress) යටතේ දක්වා තිබීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. එසේම ගොඩනැගිලි භාවිතයට ගත් දින සිට ක්ෂය රු.71,489,616ක් ගිණුම් ගත කර නොතිබුණි. | කොන්ත්‍රාත් 05ට අදාළව අවසන් බිල්පත් ඉදිරිපත් කර නොතිබීම නිසා කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව වත්කම් ප්‍රාග්ධනිත කිරීමටත් ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදනය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ සේවාව, ආරක්ෂක සේවාව හා පෞද්ගලික ශ්‍රම සේවා සැපයුම් සඳහා උපචිත වියදම් ලෙස රු.4,957,735ක් වැඩියෙන් ප්‍රතිපාදනය කර තිබුණි. | පිරිසිදු කිරීමේ සේවාව සඳහා උපචිත වියදම් ඉදිරිපත් කරන ලද්දේ ඉංජිනේරු ඇස්තමේන්තුව, BOQ සහ අදාළ ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ ලදුපත් සළකා බැලීමෙනි. ආරක්ෂක සේවා සඳහා ගෙවීම් කිරීමේදී සේවා ගිවිසුම්ගත කොන්දේසි කඩ කිරීම් සහ සේවාවේ පැවති අඩුපාඩු වෙනුවෙන් රු.282,222ක් පමණ අඩුකර ඇති අතර ශ්‍රම සේවා සැපයුම් බිල්පත්වලට ගෙවීම් කිරීමේදී පෞද්ගලික ශ්‍රම සේවා සැපයුම් යටතේ අනුයුක්ත කර සිටින ශ්‍රමිකයින් සේවයට පැමිණි දින ගණන අඩුවීම සහ අතිකාල සේවයේ යෙදවූ පැය ගණන අඩුවීම හේතුවෙන් උපචිත වියදම් ලෙස ගිණුම්ගත කළ වටිනාකමට වඩා රු.302,149ක් අඩුවෙන් ගෙවීම් කර ඇත. | ගෙවිය යුතු වියදම් නිවැරදිව තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළව සැපයුම් ණයහිමියන් වෙනුවෙන් ගෙවිය යුතු රු.329,259ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | 2019.12.31 දිනට ලැබිය යුතුව තිබුණු වවුචර 03ට අදාළ වත්කම් සම්බන්ධ තොරතුරු 2020 වර්ෂයේදී ලැබුණු බැවින් 2019 වර්ෂයට අදාළව ගිණුම්ගත කිරීමට නොහැකි විය. | වර්ෂයට අදාළ වගකීම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බාහිර ව්‍යාපෘති 02ක් සඳහා අනුයුක්ත කර තිබුණු ආචාර්යවරුන් දෙදෙනෙකු වෙත විශ්වවිද්‍යාලය විසින් 2018 හා 2019 වර්ෂවල ගෙවා තිබුණු රු.2,072,770ක් වූ වැටුප් 2020 මැයි 12 වන විටත් අදාල ව්‍යාපෘතිවලින් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. | එක් නිලධාරිනියක විසින් ගෙවිය යුතු රු.613,836ක මුදල විශ්වවිද්‍යාලයට ප්‍රතිපූර්ණය කරන ලෙස අදාළ බාහිර ව්‍යාපෘතිය වෙත ලිඛිතව දන්වා ඇති නමුත් මේ වන තෙක් ප්‍රතිපූර්ණය කර නොමැත. එසේ ප්‍රතිපූර්ණය කරන තෙක් ඇයට හිමි 2019 සැප්තැම්බර් හා ඔක්තෝබර් වැටුප වන රු.613,836ක මුදල විශ්වවිද්‍යාලය විසින් රඳවාගෙන ඇත. තවත් නිලධාරියකු ගෙන් අයවිය යුතු රු.1,458,934ක මුදල ප්‍රතිපූර්ණය කරන ලෙස දන්වමින් 2019.12.18 දින උප කුලපති මගින් අදාළ ව්‍යාපෘති භාර අමාත්‍යාංශය වෙත ලිපියක් යවා ඇත. | ව්‍යාපෘතිවලින් අදාළ ශේෂයන් ප්‍රතිපූරණය කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩලයේ නිලධාරීන් තුන්දෙනෙකු වෙත වැටුප් සහ පර්යේෂණ දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩිපුර ගෙවා තිබුණු රු.238,682ක් විගණිත දින වන විටත් (2020 මැයි 12) අය කරගෙන නොතිබුණි. | සේවයෙන් ඉවත් වී ඇති නිලධාරියකු ගෙන් අයවිය යුතු මුදල විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින්ද තවත් අයෙකුගෙන් 2020 ජනවාරි මාසයේ සිට සම වාරිකවලින් වැටුපෙන්ද අය කිරීමට නියමිත අතර එක් නිලධාරීනියක ගෙන් අයවිය යුතු අවසන් වාරිකය වන රු.68,462ක මුදල වර්තමානයේ පවත්නා වසංගත තත්ත්වය පහව ගිය පසු පියවන බව විද්‍යුත් තැපැල් මගින් දන්වා ඇත. | නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාලය විසින් බාහිර පාඨමාලා වෙනුවෙන් දරා තිබුණු රු.116,832ක වියදම් විගණිත දින වන විටත් (2020 මැයි 06) විශ්වවිද්‍යාලය වෙත අය කරගෙන නොතිබුණි. | පාඨමාලාවට අදාළ වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් අරමුදල් එම පාඨමාලාවලින් උපයා නොමැති බැවින් එම පීඨයේ වෙනත් බාහිර පාඨමාලාවක ආදායමින් එම මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | අදාළ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

---

| | නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) 383 මුදල් රෙගුලාසිය | බැංකු සැසඳුම් වාර්තා අනුව බැංකු ගිණුම් 02කට අදාලව රු.831,700ක් වූ හඳුනා නොගත් බැර ශේෂ හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | හඳුනා නොගත් මෙම ශේෂය හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ. | හඳුනා නොගත් බැර ශේෂ හඳුනාගෙන ගිණුම්වල ගැලපීමට කටයුතු කළ යුතුය. |
| | (ii) 396(ඇ) හා (ඈ) මුදල් රෙගුලාසිය | වසර 02ක් ඉක්මවූ නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ වටිනාකම රු.47,315ක් වූ චෙක්පත් 7ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි වලට අනුකූලව මෙකී චෙක්පත් සම්බන්ධව කටයුතු කළ යුතුය. |
| | (iii).770 මුදල් රෙගුලාසිය | දීර්ඝ කාලයක් තිස්සේ නිකුත් නොවන රු.961,792ක් වූ තොග අයිතම 22ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ මත ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව තොග සම්බන්ධව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2017 නොවැම්බර් 28 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අංක 10 සඳහන් තීරණය | කාරක සභා තීරණය පරිදි ස්වයං මූල්‍ය පාඨමාලාවලින් ලැබෙන මුදල් පොදු අරමුදලක් යටතේ පවත්වාගෙන යාමට ලබා දී තිබූ උපදෙස් ක්‍රියාත්මක කර නොතිබුණි. | නිශ්චිත වශයෙන්ම අවසන් කරන ලද පාඨමාලාවල අතිරික්ත මුදල් වැඩසටහන් සංවර්ධන අරමුදල (Programme Development Fund) යටතට මාරු කිරීම සුදුසු | පොදු ව්‍යාපාර කාරක සභාවේ තීරණය අනුව කටයුතු කළ යුතු වේ. |

බව 63 වන විගණන කමිටුවේදී තීරණය කරන ලදී. එම නිසා අදාළ මුදල් වැඩසටහන් සංවර්ධන අරමුදල (Programme Development Fund) යටතට මාරු කර ඇත.

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

(අ) ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල විශ්වවිද්‍යාල කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලයේ රු.205,502,778ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.159,337,064ක් විය. සමාලෝචිත වර්ෂයේ වැටුප් හා ගිවිසුම්ගත සේවා වියදම හා ක්ෂය වෙන්කිරීම් අගය වැඩිවීම ඌනතාවය වැඩිවීම කෙරෙහි සෘජුවම බලපා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ සිට ඌනතාවය අඩු/වැඩි වෙමින් පැවතියද ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය ප්‍රමාණාත්මකව සියයට 29 කින් ඉහළ ගොස් තිබුණි. එසේ වුවද විශ්ව විද්‍යාලයේ අගය එකතු කිරීම අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාලයේ ජංගම වත්කම් රු.313,742,113ක් වූ අතර, ජංගම වගකීම් රු.588,226,134ක් වූයෙන් ජංගම අනුපාතය 2:1.87ක් වූ අතර, එහි සම්මත අනුපාතය 2:1ක් විය. ඒ අනුව සම්මත අනුපාතය ඉක්මවන ලද 0.87 ක ජංගම වගකීමක් අනාවරණය විය.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වයඹ විශ්වවිද්‍යාලය විසින් 2019 වර්ෂයේ අගෝස්තු මාසයට අදාළව විදුලි බිල්පත් නිරවුල් කිරීමට ප්‍රමාදවීම හේතුවෙන් රු.45,834ක් පොලී වශයෙන් ගෙවා තිබුණි. | පරිපාලන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල වැඩ වර්ජනය හේතුවෙන් 2019 අගෝස්තු මස විදුලි බිල්පත් සඳහා අදාළ මුදල් ගෙවීම ප්‍රමාදවීම නිසා රු.45,833ක අමතර ගාස්තුවක් ගෙවීමට සිදු විය. මින් ඉදිරියට වෘත්තීය ක්‍රියාමාර්ග පවතින කාල වකවානු තුලදීත් මෙවැනි ගෙවීම් අප්‍රමාදව සිදු කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලබන බව කාරුණිකව දන්වමි. | ප්‍රමාදයකින් තොරව ගෙවීම් කිරීමෙන් අතිරේක වියදම් අවම කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පන්නල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් තක්සේරු වටිනාකම රු. 3,835,000 ක්වූ පර්චස් 711ක් තුල පිහිටි කුඹුරු ඉඩම් කොටස් 08ක් සඳහා 2013 වර්ෂයේදී රු.1,013,750ක් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර ඇතත් අදාල කුඹුරු ඉඩම් කඩිනමින් පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | ඉඩම් කැබලි 08 පවරා ගැනීම සම්බන්ධව ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 4(4) යටතේ විරෝධතා පරීක්ෂණයක් සිදු කිරීමට සහ අත්පත් කාර්යය කඩිනම් කර ගැනීම සඳහා 38(අ) අතුරු විධානය යටතේ ආඥාවක් ලබා ගැනීම සඳහා ලේඛකාධිකාරීතුමා මගින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉල්ලීමක් කර ඇත. | අදාළ ඉඩම් කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් "The assessment of water and sediment quality and associated sea urchin of the gulf of mannar coastline" නැමැති ව්‍යාපෘතිය සඳහා 2014 හා 2016 වර්ෂවලදී විශ්වවිද්‍යාලය වෙත ලබාදී තිබුණු රු. 3,437,160ක මුදලින් 2017 වර්ෂයේ සිට රු.2,266,439ක් අදාල ව්‍යාපෘතිය වෙනුවෙන් යෙදවීමකින් තොරව වර්ෂ 3කට අධික කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි. | මෙහි පළමු අදියර අවසන් කර ඇති අතර 2019.08.01 දිනැති උපකුලපතිතුමාගේ ලිපියට අනුව අදාළ නිලධාරිනිය වහාම ක්‍රියාත්මක වන පරිදි උපදේශකවරයෙකු ලෙස විශ්වවිද්‍යාලයෙන් මුදා හැර ඇති බැවින් දෙවන අදියරෙහි කටයුතු තාවකාලිකව නැවතී ඇති අතර නැවත මෙම ව්‍යාපෘතියේ කටයුතු 2020 වර්ෂයේ සිට ආරම්භ කරන බව දන්වා ඇත. | අදාළ ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කර ලැබී ඇති අරමුදල් කඩිනමින් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාලය විසින් ප්‍රමාණවත් පරිදි තොරතුරු පවත්වාගෙන නොයාම හේතුවෙන් ව්‍යාපාර හා අධ්‍යයන මූල්‍ය පීඨයේ 2016-2019 කාලය තුල එකතුව රු.1,793,067ක පර්යේෂණ දීමනා ලබාගත් දේශකවරුන් 08 දෙනෙක් විසින් පර්යේෂණ කාලය අවසානයේ පර්යේෂණ වාර්තා පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන තිබේද යන්න පිළිබඳව තොරතුරු විගණනයට අනාවරණය කරගත නොහැකි විය. | ඔවුන්ගේ අවසන් පර්යේෂණ වාර්තා පීඨ පර්යේෂණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස දැනුම් දීමට කටයුතු කරනු ලැබේ. ඉදිරියේදී පර්යේෂණය අවසන් කළ පසු අදාළ පර්යේෂණ වාර්තාව පීඨ පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු බවට සියළුම ආචාර්යවරුන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | පර්යේෂණ වාර්තා සඳහා අදාළ අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2011 අප්‍රේල් 20 දිනැති අංක 1/2011 දරන උසස් අධ්‍යාපන චක්‍රලේඛයේ 03(i) ඡේදයට පටහැනිව ව්‍යාපාර | පර්යේෂණ අධීක්ෂණ කමිටුවක් ඉදිරියේදී ස්ථාපිත කළ පසු අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට බලාපොරොත්තු වෙමි. | අදාළ කමිටු පත්කර අනුමැතිය ලබාගත යුතුය. |

අධ්‍යයන හා මූල්‍ය පීඨයේ දේශකවරුන් 07 දෙනෙකු වෙත 2015-2019 කාලය තුල අවස්ථා 12කදී පිළිගත් ප්‍රකාශනවල පළකර වර්ෂ කිහිපයක් ගත වූ පර්යේෂණ වාර්තා සඳහා ඊට පසු වර්ෂවලදී පර්යේෂණ දීමනා ලෙස රු.2,881,619ක් ගෙවා තිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වයඹ විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි සහ ව්‍යවහාරික පාඨමාලා ඒකකය 2018 නොවැම්බර් සිට ක්‍රියාත්මක වෙමින් තිබුණද 2020 මැයි වන විටත් විශ්වවිද්‍යාලයේ ස්වයං මූල්‍ය පාඨමාලාවන් මෙම ඒකකය යටතට අන්තර්ග්‍රහණය කර නොතිබුණු අතර මෙම ඒකකය සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක්ද අනුයුක්ත කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි සහ ස්වයං මූල්‍ය පාඨමාලා ඒකකය යටතට එම පාඨමාලා අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර එම ඒකකය වෙත වැඩ බලන පදනම මත නිලධාරියකු පත් කර ඇත. | අදාළ පාඨමාලාවන් අදාළ ඒකක යටතට පත්කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වෛද්‍යපීඨය සඳහා අනුමත කාර්යය මණ්ඩලයෙන් සියයට 19ක ප්‍රමාණයක කාර්යය මණ්ඩලයක් පමණක් බඳවා ගැනීමට හැකි වී තිබුණි. | වෛද්‍ය පීඨයට අදාළ තනතුරු සඳහා ඉදිරියේදී තවදුරටත් සුදුසු අයවළුන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාළ පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | තාක්ෂණ පීඨයේ 2017/2018 වර්ෂවලදී බඳවාගත් සිසුන්ගෙන් සියයට 06ක ප්‍රමාණයක් අධ්‍යයන කටයුතුවලින් ඉවත්වී ගොස් තිබුණි. | 2017/2018 වසරේදී සිටිය යුතු මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 483ක් වුව ද ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව (දැනට සිටින ශිෂ්‍ය සංඛ්‍යාව) 450ක් විය. මේ අනුව සිසුන් 33 දෙනෙකු අධ්‍යයන කටයුතු සඳහා සහභාගී වී නොතිබුණි. ඇතැම් සිසුන් තෙවන වසරට සුදුසුකම් නොලැබීම නිසා ඇති වූ පසුබෑම නිසාත්, ඇතැම් සිසුන් රැකියා සඳහා යොමු වීම ආදී කරුණු නිසාත් අධ්‍යයන කටයුතු සඳහා සහභාගී නොවන බව දන්වා ඇත. | විශ්වවිද්‍යාලය හැර ගිය සිසුන් පිළිබඳ අධ්‍යයනයක් කර පාඨමාලා හැරයාමේ ප්‍රවණතාවය අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ලෝක ශ්‍රේණිගත කිරීම සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ශ්රේණිගත කිරීම් අනුව 2018 වර්ෂයේදී පිළිවෙලින් 8139 හා 08 වන ස්ථාන හිමිකරගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් 8358 හා 08 | විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් සඳහා විශ්විද්‍යාලයේ පීඨ ගණන, සිසුන් ගණන, විශ්වවිද්‍යාලය මගින් සිදු කරන පර්යේෂණ, පර්යේෂණ සමුළුවලට අදාළ තොරතුරු ඉවහල් වේ. විශ්වවිද්‍යාලයේ පීඨ ප්‍රමාණයට අනුව අනෙකුත් සාධක තවම | ශ්‍රේණිගත කිරීම්වල ඉහළ වර්ධනයක් ලබාගැනීම සඳහා දුර්වලතා ඉවත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | වන ස්ථාන හිමි කරගෙන තිබුණි. ඒ අනුව ලෝක ශ්‍රේණිගත කිරීම්වලදී විශ්වවිද්‍යාලය පසුබෑමකට ලක්වී තිබුණි. | වර්ධනය වී නොමැත. එයද ශ්‍රේණිගත කිරීමේ අගය පහළ වැටීමට බලපානු ලබයි. වයඹ විශ්වවිද්‍යාලයට හිමි වන ස්ථානය වර්ධනය කර ගැනීම සඳහා 2020 වර්ෂයේ පර්යේෂණ සමුළු (ජාතික හා ජාත්‍යන්තර) කිහිපයක් පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර මේ වසරේ රටේ පැවති තත්ත්වය හමුවේ එම සමුළු පැවැත්වීම සැලසුම් කර තිබූ පරිදි පැවැත්වීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත. එසේම විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුවද නිතරම යාවත්කාලීන කරමින් ලෝක ශ්‍රේණිගත කිරීමේ වයඹ විශ්වවිද්‍යාලයට හිමි ස්ථානය වර්ධනය කර ගැනීමට කටයුතු සිදු කරනු ලැබේ. | |
| (ඉ) | වැඩිදුර අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වී නියමිත කාලය තුල ආපසු නොපැමිණි කථිකාචාර්යවරු හත්දෙනෙකුගෙන් අයවිය යුතු රු.50,781,258ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | විමසුමේ සඳහන් බැඳුම්කර ගිවිසුම් උල්ලංඝනය කළ ආචාර්යවරුන්ගේ මුදල් අයකර ගැනීම සම්බන්ධව කටයුතු කරමින් පවතී. | අදාළ බැඳුම්කර මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී හා පසුගිය වර්ෂ 03කදී භාණ්ඩාගාරයෙන් හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබාදී තිබුණු ප්‍රාග්ධන ප්‍රතිපාදන මුදලින් රු.81,946,192ක අරමුදල් උපයෝජනය කර නොතිබුණි. | 2020 ජනවාරි මස රුපියල් මිලියන 41.8ක් සහ 2020 පෙබරවාරි මස රුපියල් මිලියන 71.6ක් අදාළ බිල්පත් සඳහා ගෙවීම් කර ඇති බැවින් අරමුදල් ඌන උපයෝජනයක් සිදුවී නොමැත. | අරමුදල් කඩිනමින් ඵලදායි ලෙස යොදවා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.5 නිශ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| තක්සේරු අගය රු.500,000ක් වූ වෑන් රථයක් 2014 වර්ෂයේ සිට ධාවන කටයුතු සඳහා යොදවා ගෙන නොතිබියදී, එම කාල පරිච්ඡේදය තුලදී අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.205,264ක් වැය කර තිබුණි. | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ ජංගම බහුමාධ්‍ය ඒකකය නිර්මාණය කිරීම සඳහා වායු සමීකරණ යන්ත්‍රයක් යොදා අළුත්වැඩියා කිරීමෙන් අනතුරුව භාර දීමට නියමිතය. අළුත්වැඩියා කටයුතු සිදු කරන තෙක් නඩත්තු අංශයෙහි සේවා අවශ්‍යතාවන් සඳහා යොමු කර ඇත. | වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය සමඟ සැසඳීමේදී විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ තනතුරු 64 ක් ද අනධ්‍යන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 60 ක්ද සමාලෝචිත වර්ෂය අවසානයට පැවති නමුත් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | පවතින පුරප්පාඩු පිරවීමට කඩිනම් පියවර ගත යුතුය. |
| විගණනයට ඉදිරිපත් කරන ලද වර්තමාන කාර්යසාධන වාර්තාව අනුව සමස්ත කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු සියයට 13ක් වන අතර ස්ථිර අධ්‍යයන හා සහාය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සියයට 16ක් විය. | විවධ කාරණා හේතුවෙන් ඇති වන පුරප්පාඩු පිරවීම සඳහා වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක 974 ප්‍රකාරව නැවත වරක් මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුව ඇති අතර, මේ සඳහා යම් කාල සීමාවක් ගත වන අතර චක්‍රලේඛ අංක 876 යටතේ ඇති තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නාම ලේඛන සකස් කර එවීමේදී ඇති වන ප්‍රමාදයද පුරප්පාඩු පිරවීමේ ක්‍රියාවලියේ වේගවත් බව කෙරෙහි බලපෑමක් ඇති කරයි. | අදාළ පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අනුව පීඨයන් 02ක ප්‍රගතිය විගණිත දින වන විටත් (2020 මැයි 18) ඉදිරිපත් කර නොතිබූ අතර ඉදිරිපත් කළ පීඨ 3හි ප්‍රගතිය සමාලෝචනය කිරීමේදී අරමුණු 21ක් ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | එම පීඨ දෙකේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ගෙන්වා ගැනීමට කටයුතු කරන අතර 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඉටු කිරීමට අපොහොසත් වූ ක්‍රියාකාරකම් 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර එම වර්ෂයේදී ඉටු කිරීමට බලාපොරොත්තු වේ. | අදාළ ප්‍රගතිය ඉදිරිපත් කළ යුතු අතර අරමුණු ළඟා කර ගැනීමට ක්‍රියා කළ යුතු වේ. |